
**20 නි ශතවර්ෂයේ හෙළ ද්වීපයේ පහලව සිටි ශ්‍රේෂ්ඨ විරුවන් පිළිබඳ මතකයන් කෙමෙන් ඇත්වෙමින් පවති. විශේෂයෙන් හෙළ ද්වීපයේ නව පරපුර එම විරුවන් ගැන දන්නේ අල්ප වශයෙනි.**

**ඉතිහාසය නොදන්නා ජාතියකට අනාගතයක් තිබේද යන්න සැක සහිතය. මෙත්තානන්ද වැනි ශ්‍රේෂ්ඨ හෙළයින් දැයට අහිමි වී පසුගිය ඉල් මාසය වන විට වසර 39 ක් ගත වී ඇත. නව පරපුරට කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යයට පවා ඔහු අමතක වී ගොස්ය. මෙම මඩ ගොහොරුවෙන් ගොඩ එන්නට අප අදිටන් කරගත යුතුය. එම විරුවන්ට දැක්විය හැකි ඉහළම සැලකිල්ල එයයි.**

**මේ ලිපිය ඒ නිමිත්තෙනි. ඉංග්‍රීසියෙන් සකස්ව තිබූ මෙම ලිපිය " දම්සර "ට මෙන්ම ලේක්හවුස්, ටයිම්ස්, උපාලි සමූහය ඇතුළු සියළු ප්‍රධාන මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත යවා ඇතත් ඔවුන් එය පළ කළේ නැත. (සන්ඩේ ස්ටෑන්ඩඩ්ස් හැරුණු විට) ඒ මෙරට ජනමාධ්‍ය ගමන් කරන "මඟ" පිළිබඳ තවත් සාක්ෂියක් පමණි.**

**කෙසේ වුවත් " දම්සර " ට ලැබුණු ඉංග්‍රීසි ලිපියේ සිංහල පරිවර්තනය පළ කිරීම මෙත්තානන්ද හෙළ වීරවරයාට " දම්සර " පාඨකයන් දක්වන උපහාරයයි.**

**- කතෘ -**



# අධ්‍යාපනඥයෙකු හා විශිෂ්ඨ දේශප්‍රේමියෙකු වූ එල්. එච්. මෙත්තානන්ද මහතා (1894-1967)

**රමණී ඩී. වික්‍රමරත්න විසිනි**

අධ්‍යාපනඥයෙකු, මානව හිතවාදියෙකු හා දේශප්‍රේමියෙකු වූ බෞද්ධ පුනර්ජීවයට මඟ පෑදූ එල්.එච්. මෙත්තානන්ද මහතා පරලෝ සැපත් වී පසුගිය නොවැම්බර් 16 ට වසර 39 ක් සපිරුනි.

අභාවප්‍රාප්ත වී වසර 39 ක් ගත වුවද, සුවිශේෂී ලංකා පුත්‍රයෙකු වන එතුමාගේ ශ්‍රී නාමය ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමක් අප සිත් තුළ දල්වයි. ජනිත කරයි. එතුමා ගැන කියවන විට, ලියන විට එක් ජීවිත කාලයක් තුළ එක මිනිසෙකුට මේ තරම් භාරදූර, මේ තරම් විශාල වැඩ කොටසක් කරන්නට පුළුවන් වී දැයි කෙනෙකු විශ්මයට පත් කරයි.

පුවත්පත් කලාවේදියෙකු වූ ඩී.බී ධනපාල, මෙත්තානන්ද මහතා ගැන ලියූ ලිපියක් 2004 නොවැම්බර් 3 දා "අයිලන්ඩ්"' පුවත්පතේ පළ විය. එහි මෙසේ සඳහන් විය. "බෞද්ධ සම්මේලන දුසිම් භාගයකට වැඩි ගණනක ශක්තියටත්, එයටම එක් වූ තරුණ බෞද්ධ සමිති සියයක ශක්තියටත් වැඩි ජවයක් මෙත්තානන්ද මහතා තුළ විය".

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තමන් වෙත පවරා ගත් වගකීම හා කැපවීම මගින් එතුමා අපට ශේෂ කොට ඇත්තේ අසමාන දායාදයකි. එදා මෙදා තුර එතුමාගේ·ඝණයට වැටෙන ඇත්තෝ විරලය. මේ සියල්ල මෙත්තානන්ද මහතා කළේ ජාතියට කරන සේවයක් ලෙස විනා කීර්තිය හෝ ලාභය සඳහා නොවේ. අද සමාජයේ එවැන්නන් දුලබය. අප සියලු දෙනා, විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නියුක්තිකයන්, එල්.එච්. මෙත්තානන්ද මහතාගේ පෞරුෂය කෙබඳු එකක් වී දැයි තේරුම් ගෙන තම තමන්ගෙන්, ඊට අපේක්ෂා කරන්නේ මොනවාගේ සේවයක් දැයි තේරුම් ගැන්ම වැදගත්ය. වචනයෙන් එතුමාගේ සේවයට සාධාරණයක් කිරීම උගහටය.

ලොකුසතු හේවා මෙත්තානන්ද 1896 මාර්තු 19 දා අම්බලන්ගොඩ කලුවඩුමුල්ලේ දී උපත ලැබුවේය.එතුමාගේ දෙමාපියෝ වෙළඳ ව්‍යාපාරිකයෙකු වූ එල්.එච් කෝවිස් ද සිල්වා සහ වීරසූරිය කරුනාහාමි වූහ. මෙත්තානන්ද පිරිමි සහෝදරයින් හතර දෙනෙකු සහ එක සහෝදරියක අතර වැඩිමලා විය. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙහිදී මූලික අධ්‍යාපනය ලබමින් විශිෂ්ඨ වාර්තාවක් තබා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේදි ද්විතීය අධ්‍යාපනය ලැබූ මෙත්තානන්ද 1912 දී කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ සහ 1913 දී ලංඩන් මැට්‍රිකියුලේෂන් විභාග සමත් විය. 1914 - 1915 අතර එතුමා කොළඹ ගුරු අභ්‍යාස විද්‍යාලයෙහි දී ගුරු පුහුණුව ලැබීය. 1930 ජූලි මාසයේදී ලන්ඩන් ඩේ ට්‍රේනිං විද්‍යාලයෙන් අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමාවක් ලත් එතුමා අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සඳහා අඛණ්ඩව ඉගෙනීමේ කටයුතු වල යෙදුනේය.

මේ කාල පරිච්ඡේදය තුළ එනම් 1912 දී පානදුර ශ්‍රී සුමංගල පිරිමි පාසලෙත් 1916- 18 තුල කළුතර හෝලික්‍රොස් විද්‍යාලයේත් උප ගුරුවරයෙකු වශයෙන් එතුමා සේවය කළේය.

1919 දී උප ගුරුවරයෙකු වශයෙන් ආනන්ද විද්‍යාලයට බැදුණු මෙත්තානන්ද මහතා 1923 දී පරම විඥානාර්ථ බෞද්ධ සංගමය විසින් එවකට අළුත් පාසලක් වූ නාලාන්දාවේ ප්‍රධානාචාර්ය වරයා වශයෙන් පත් කරනු ලැබීය.

1923 දී මෙත්තානන්ද මහතා මුදලි ජේ.ඩී.එස් වික්‍රමසූරියගේ දියණියක් වූ සීලියා සමඟ විවාහ විය. ඔවුනට පුත්තු තුන් දෙනෙක් හා දියණියෝ දෙදෙනෙක් වූහ. ඒ සියලු දෙනා යහපත් අධ්‍යාපන සුදුසුකම් ලබා ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනවත් පුරවැසියන් වී පියාගේ නමට ගෞරවයක් අත්කර දීමට සමත් වූහ.

පාසලේ වැඩ, සමාජ සේවය, බෞද්ධ කාර්යභාරයන් යන මේ සියල්ල ඉසුලූ මෙත්තානන්ද මහතා ස්වාමිපුරුෂයෙකු හා පියෙකු වශයෙන් තමන් වෙත පැවරුණු සියලු යුතුකම් නොපිරිහෙලා ඉටු කළේය. මේ සියලු යුතුකම් හා කාර්යභාරයන් එතුමා උපරිම ශක්තිය යොදා ඉෂ්ඨ සිද්ධ කළේ කාලය අරපිරිමැස්මෙන් හසුරුවා ගනිමිනි.

එතුමාගේ සමාගම දරුවන් ආදරෙන් පැතුවද " රටට කළ සේවය " ස්වාර්ථකාමී වීමට තරම් එතුමාට ඉඩ නොතැබීය.

එතුමාගේ මරණින් අවුරුදු 39 ක් ගත වූ පසුගිය ඉල් පුර පසළොස්වක දා, එතුමාගේ දූ දැරවෝ කොළඹ ඉසිපතනාරාම විහාරස්ථානයේදී ගෞරවණීය විජිත ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශණයක් පවත්වා පියාණන්ට පිං පැමිණවූහ.

### මෙත්තානන්ද මහතාගේ පෞරුෂය

මෙත්තානන්ද මහතා හොඳින් දැන සිටි, මිනිසුන් වශයෙන් එතුමාට ගෞරවයෙන් සැලකූ කවුරුත් එතුමා තම ගමන් මඟ සැකසීමට පියවර 4 ක් පාදක කරගත් බව දැන සිටියහ.

1. එතුමා පෞද්ගලික ලාභ ප්‍රයෝජන නොතැකීය.
2. අනවශ්‍ය වස්තුව රැස් කළේ නැත.
3. වගකීමෙන් තොර ප්‍රකාශ කළේ නැත
4. ප්‍රජාතන්ත්‍රවාදය නිරතුරුව රැක්කේය.
5. චාම් දිවි පෙවෙතක් ගෙන ගියේය.

මෙත්තානන්ද මහතා ඇත්ත වශයෙන් අපූර්ව මිනිසෙක් විය. ප්‍රතිපත්ති ගරුක බෞද්ධයෙකු වශයෙන් ඔහු නිර්භීත විය. ආත්මාර්ථකාමී නොවීය. ජාතියේ යහපත වෙනුවෙන් වගකීම් දැරූ අතර ඒ වෙනුවෙන් ජීවිතය කැප කළේය.

මිත්‍රයෙකු වශයෙන් එතුමා කල්‍යාණ මිත්‍රයෙක් විය. අවංක විය. විනීත විය. කාර්ය ශූරත්වය හා ස්ථානෝචිත ප්‍රඥාව එතුමා කෙරේ විය. කාටත් සාධාරණ විය. මෙවන් පැසසිය යුතු ගුණාංග ඒකරාශීව එක තැනැත්තෙකු කෙරේ පිහිටා තිබීම ඇත්තෙන්ම පුදුමයට හේතුවිය යුතු වුවද මෙත්තාන්නද මහතා තමාගේ හා තම පවුලේ පැවැත්ම සඳහා තෝරාගත් පිළිවෙත එය විය. එතුමා සමාජයේ විවිධ ස්ථරවල අය සමඟ මිත්‍ර වීමටත්, ඒ කාගේත් ගෞරවය දිනා ගැන්මටත් සමත් විය.

එයම, එතුමාගේ ගුණ යහපත්කම හා පෞරුෂයට සාක්ෂියක් විය. මේ ගුණාංග එතුමා තමා විසින් පවරා ගන්නා ලද ජාතික කාර්යභාරය ගෙන යාමට අවශ්‍ය සහාය ලබාදීමට පොහොසත් විය.

### මෙත්තානන්ද මහතා ජාතියට ඉටු කළ සේවය

මෙත්තානන්ද මහතා ජාතියට කල සේවය විවිධාකාර විය. ඒවා සාර්ථක කර ගැනීමට පුළුවන් වුයේ තමා කෙරේ හා තමන් වටා සිටි අය කෙරේ එතුමා පැනවූ ප්‍රමිතීන් නිසාය. එම ප්‍රමිතීන් කවරේදැයි පහත දැක්වෙන අතර මේ තරම් විශාල කාර්යභාරයක් එක පුද්ගලයෙකුට කරන්නට පුළුවන් වී දැයි සිතේ.

### අධ්‍යාපනය

මෙත්තානන්ද මහතාගේ අංක එකේ ආදරය අධ්‍යාපනයට විය. එතුමාගේ ලිය කියවිලි පරීක්ෂා කරත්ම එතුමා වැඩ කළ හැම පාසලකම වැඩ කටයුතු සඳහා කොතරම් කාලයක් හා ශ්‍රමයක් වැය කළේද කියා පෙනී යයි.

ළමයෙකුගේ පාසල් ජීවිතය තුළ දැනුම, ක්‍රීඩා, පරාර්ථ සේවය යන ක්ෂේත්‍රයන්හි ඔහුට ලබාගත හැකි උපරිම දැනුම් හා යහපත සැලසීමට එතුමා වෙහෙස විය. ශිෂ්‍ය ජීනයට ප්‍රමුඛස්ථානය දුන් මෙත්තානන්ද මහතා තමා සේවය කළ හැම පාසලකම ශිෂ්‍යයන්ගේ විනය වර්ධනයට අවශ්‍ය පසුබිම හා පියවර සැලසීය.

තමා ඉගැන් වූ හෝ ප්‍රධානත්වය දැරූ හෝ හැම පාසලකම ගම් පළාත් වලින් පැමිණ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන්, විද්‍යාව ඉගෙන ගැනීමටත් එසේම විද්‍යාඥයන් හා වෛද්‍යවරුන් [illegible]යෙන් සුදුසුකම් ලබා ගැනීමටත් එතුමා උනන්දු කළේය.

1932 -1936 එතුමා ආනන්ද විද්‍යාලයේ වැඩ බලන අධිපති වශයෙන් සිටි කාලයේදී සහ 1945 - 1955 විද්‍යාලාධිපති වශයෙන් සේවය කළ කාලයේදී, පාඨමාලා ප්‍රායෝගික හා නිර්මාණාත්මක කිරීමෙන් අධ්‍යාපන මට්ටම නගා සිටුවීය. ශිෂ්‍යයන්ට වරදට දඬුවම් දෙනු වෙනුවට වගකීම් දැරීමටත්, ආත්ම ශක්තිය වඩා ගැනීමටත් ඔවුනට ඉගැන්වීය. ළමුන් සිංහල. දෙමළ යන දෙබස දැන සිටිය යුතු යැයි තදින් විශ්වාස කළ මෙත්තානන්ද මහතා මේ භාෂා දෙක ඉගෙනීම ආනන්ද විදුහුලේ 1 වන 2 වන ශ්‍රේණි වලට අනිවාර්ය කළේය. පාසලින් පිටවී ගොස් සමාජගත වූවාට පසු ඉංග්‍රීසි හොඳ හැටි භාවිතා කිරීමේ හැකියාව ලබාදීම සඳහා ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හොඳට ඉගැන්විය යුතුය, යන මතය එතුමා දැරීය. පුරා අවුරුදු 4 ක් එතුමා ආනන්ද විද්‍යාලයේ ඉංග්‍රිසි හා ලතින් යන භාෂාද්වය ඉගැන්වීය.

එතුමා යටතේ ආනන්ද විද්‍යාලය දුන් අධ්‍යාපනය, බෞද්ධ සම්ප්‍රදාය පදනම් කොට ගත්තක් වූ අතර මව් භාෂාව, ඉගැන්වීමේ මාධ්‍යය විය. පාඨමාලාවට හස්ත කර්මාන්ත, උද්‍යාන විද්‍යාව හා ගෙවතු වගාව ඇතුළත් කරන ලද අතර වෘත්තිමය අධ්‍යාපනය යටතේ වඩු වැඩ, පොත් බැඳීම හා යකඩ වැඩ උගන්වනු ලැබිණ. මෙහි අදහස වූයේ කය වෙහෙසා වැඩ කිරීම අගය කිරීමට ශිෂ්‍යයන් හුරු කිරීමත්, වෘත්තිමය අධ්‍යාපනයක් වෙත යොමු කිරීමත්ය.

මෙත්තානන්ද මහතාගේ කාලයේදී ආනන්ද විද්‍යාලයේ පුස්තකාලය දියුණු කරන ලද අතර දැනුම වඩා ගැනීම සඳහා කියවීම කෙරේ ශිෂ්‍යයෝ නතු කරනු ලදි. මෙත්තානන්ද මහතා පුද්ගලිකව පාසල් විද්‍යාගාරය තැනීමේ කටයුතු නිරීක්ෂණය කළේය. අදත් භාවිතා කරන්නේ එසේ ඉදිවුණු ආනන්ද විද්‍යාගාරයයි. ආනන්ද විහාරයට අත්තිවාරම දැමුණේ මෙත්තානන්ද මහතාගේ කාලයේදීය. පාසල් නේවාසිකාගාරය විශාල කිරීම, ගුරු දෙගුරු සමිතිය පටන් ගැන්ම හා ආනන්ද පරෝපකාර සමිතිය පිහිටුවීම මෙත්තානන්ද මහතා විසින් ආනන්දයේ පටන්ගත් තවත් සත්ක්‍රියාවන්ය. පරෝපකාර සමිතිය විසින් ආනන්ද ශිෂ්‍යයන් තුළ පරෝපකාර බීජුවට වපුරනු ලැබිණ. අධ්‍යාපනයට මුළුමනින්ම කැපවුණු මෙත්තානන්ද මහතා, විද්‍යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීමට ආධාර එකතු කරනු පිණිස සැණකෙළි හා සල්පිල් පැවැත්වීය.

ආනන්දයේ ආචාරය මණ්ඩලයට විශිෂ්ඨ ගුරු පිරිසක් බඳවා ගැනීමට මෙත්තානන්ද මහතා සමත් වූ අතර, ආනන්ද විද්‍යාලයත් එහි අනාගතයත් සම්බන්ධයෙන් එතුමා කෙරේ වූ දර්ශණය අගය කල ප්‍රකට බෞද්ධ දානපතීහු නොමසුරු පරිත්‍යාගයෙන් සිය සහයෝගය පළ කළහ. පාඨමාලා අධ්‍යාපනයට දෙන වැදගත් තැන අතිරේක අධ්‍යයන විෂයන්ටද දෙනු ලැබිණ.

මෙත්තානන්ද මහතා ආනන්ද විද්‍යාලාධිපති වශයෙන් සේවය කළ කාලය තුළදී ආනන්දය පිහිනීම, බොක්සිං, කෙඩට්, බැට්මින්ටන් සහ ක්‍රීඩා ක්ෂේත්‍ර තුළ ඉමහත් දස්කම් ප්‍රදර්ශණය කළේය.

1952, ආනන්දයට විශේෂයෙන් වැදගත්ය. ඒ අවුරුද්දේ හොඳම අන්තර් පාඨශාලා කෙඩට් කණ්ඩායමට දෙන ත්‍යාගය වන හර්මන් ලෝස් කුසලාන ආනන්දය දිනා ගත්තේය. අන්තර් පාඨශාලා බොක්සිං තරඟයෙන්ද ආනන්ද විද්‍යාලය ජයග්‍රාහී විය. ඒ අවුරුද්දේ ආනන්ද ශිෂ්‍යයන් බොහෝ දෙනෙක් පිහිණුම් හා ක්‍රීඩා අංශ වලද ශූරතා හිමිකර ගත්හ.

කෙසේ වුවද, ආනන්ද ආදි ශිෂ්‍යයන්, හමුදාවට බැදෙන්නට ඉල්ලුම් කළ විට එම ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප විය. හේතුව එය බෞද්ධ පාසලක් වීමය. මෙය, මෙත්තානන්ද මහතා විමතියට පත් කළ අතර, මේ පිළිබඳව ඩී.එස්. සේනානායක මහතාට පැමිණිලි කොට, හමුදාවට බැදීමට ආනන්ද ශිෂ්‍යයන්ගේ සුදුසුකම් ඔප්පු කළ පසු ක්‍රම ක්‍රමයෙන් එහෙත් අකැමැත්තෙන් බඳවා ගැන්ම පටන් ගැනින.

1936 - 1945 වකවානුවේදී මෙත්තානන්ද මහතා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති විය. එවකට ධර්මරාජය දුෂ්කරතා ගණනාවකට මුහුණ දෙමින් සිටියෙන් එකී ගැටලු නිකාරණය කොට, විද්‍යාලයට නව පණක් ලබා දීමට මෙත්තානන්ද මහතා සමත්වනු ඇත යන විශ්වාසය එම පත් කිරීමට හේතු විය. පාසල මුහුණ දෙමින් සිටි ප්‍රශ්න අතර එය නඩත්තු කිරීමට මුදල් නොතිබීමත්, ගුරුවරුන් අතර අසමගියට තුඩුදුන් උඩරට - පහතරට භේදයත් මුල්තැන ගත්තේය. මෙය කුල ප්‍රශ්නයක් වූවාද විය හැක.

කෙසේ හෝ මේ වාද භේද ධර්මරාජ විද්‍යාලයේ ප්‍රගතියට බාධා කරවිය.

මෙත්තානන්ද මහතාගේ චරිතයේ විශේෂ ලක්ෂණය වන, උපායශීලී බව හා අන්‍යෝන්‍ය සම්බන්ධතා විෂයෙහි ඇති දක්ෂතාවය යොදා ගනිමින් ගුරු මණ්ඩලය අතර එකමුතුකම ගොඩ නගා පාසල ප්‍රගති මාර්ගයට ගෙන ඒමට එතුමා සමත් විය.

මෙත්තානන්ද මහතා විද්‍යාලායාධිපති තනතුර දැරූ කාලය තුළ ධර්මරාජ විද්‍යාලය මහනුවර පාසල් අතර වඩාත්ම ජනප්‍රිය පාසල වූ බව වාර්තාගතය. ඒ කාලය තුළ ධර්මරාජයට පුස්තකාලයක් හා දෙමහල් විද්‍යාගාරයක් එක් විය. 1936 - 1945 අතර පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාවද 440 සිට 805 දක්වා ඉහළ නැංගේය.

ධර්මරාජය අංග සම්පූර්ණ වූ ද, අධ්‍යාපන මට්ටම අතින් වැඩිදියුණු වූද තත්වයකින් නැගී සිටියේ එම වකවානුව තුළය. මෙත්තානන්ද මහතා විද්‍යාලාධිපති තනතුර භාරගන්නා විට ණයබරින් මිරිකී සිටි ධර්මරාජය එතුමා 1945 දී අස්වී යනවිට රු 128,213.94 ගිණුම් ශේෂයක් ඉතිරි කර ගියේය. එදා එය ලොකු මුදලක් බව නොකිවමනාය.

මෙත්තානන්ද මහතාගේ අවංකත්වය හා ඍජුභාවය අසාමාන්‍යය. ආනන්දයේ හා ධර්මරාජයේ අභිවෘධිය පැතුවන් දුන් සියලු ආධාර එතුමා විසින් ලේඛණගත කරනු ලැබිණ.

07 පිටුව